02

00536

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 6 මට්ටම
අවසාන පරීක්ෂණය - 2017/2018
**LWU4323/ LLU6715 – කම්කරු නීතිය**
කාලය පැය 3 යි

---

දිනය: 2020 පෙබරවාරි 26 වේලාව: ප.ව.01.30 - ප.ව 04.30

---

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. "පොදු නීතිය තුළ සේවායෝජකයා යනු, සේවකයන් විසින් සිදු කරන ගිවිසුම් කඩ කිරීම් සඳහා අපරාධමය දඬුවම් නියම කිරීමේ හැකියාව ඇති, තම සේවකයා විෂයෙහි හිමිකාරත්ව අයිතියක් දරන්නෙකු ලෙස සලකනු ලැබූ කාලයක් පැවතුණි. එම අවධියේ සිට පොදු නීතිය බොහෝ දුර පැමිණ ඇති නමුත්, නූතන පොදු නීතිය තුළ තවමත් පාර්ශවයන්ගේ අයිතිවාසිකම් තීරණය කිරීමෙහි ලා සේවා ගිවිසුම යම් පමණකට තීරණාත්මක ලෙස සැලකේ".
*S.R De Silva, The Contract of Employment, The Employers Federation of Ceylon, 2008 p 21.*

ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නේද?

ශ්‍රී ලංකාවේ කම්කරු නීති ක්ෂේත්‍රයේ සිදු වූ වර්ධනයන් ඇසුරින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 20)

2. (අ) පෞද්ගලික අංශය තුළ පරිවාසිකයින්ගේ රැකියා සුරක්ෂිතතාව සම්බන්ධ නෛතික තත්වය පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුර අදාළ නඩු තීන්දු ඇසුරින් තහවුරු කළ යුතුය.

(ලකුණු 10)

(ආ) 'AMC බිල්ඩර්ස්' යනු රටේ විවිධ පළාත්වල දැනටමත් ක්‍රියාත්මක ව්‍යාපෘති ගණනාවක් සහිත ප්‍රසිද්ධ ඉදිකිරීම් සමාගමකි. 2015 ජනවාරි මාසයේදී 'AMC බිල්ඩර්ස්' විසින් වැල්ලවත්ත ප්‍රදේශයේ නිවාස ව්‍යාපෘතියක ජලනල කාර්මිකයකු ලෙස සේවය කිරීම සඳහා චානක බඳවා ගන්නා ලදී. කෙසේ වෙතත් ඔහුව වැඩබිමෙන් වැඩබිමට මාරු කරනු ලැබූ අතර ඔහුගේ ගෙවීම් සතිපතා කරනු ලැබිණි. සමාගම මගින් ඔහුට 'අනියම් සේවක' යන තනතුර ලබා දී තිබුණි. 'AMC බිල්ඩර්ස්' හි අනෙකුත්

00536

සේවකයින්ට ගෙවනු ලැබූ දීමනාවන් ඔහුට ගෙවනු නොලැබුණි. 2019 දෙසැම්බර් මාසයේදී තවදුරටත් ඔහුගේ සේවය අනවශ්‍ය වේ යන පදනම මත ඔහුගේ සේවය අවසන් කරන ලදී.

ජානක වසර දෙකක කාලයක් සඳහා වූ ගිවිසුමක් මත සහායක ඉංජිනේරුවරයෙකු ලෙස සමාගම විසින් බඳවා ගනු ලැබීය. 2020 පෙබරවාරි 1 වන දින ඔහුගේ ගිවිසුම අවසන් වීමට නියමිතය. ගිවිසුම්ගත කාලය අවසානයේදී ජානකගේ ගිවිසුම අලුත් නොකිරීමට 'AMC බිල්ඩර්ස්' තීරණය කර ඇත.

තම සේවා අවසන් කිරීම්වලට එරෙහිව සහනයක් ලබා ගැනීමට අයිතියක් පවතීද යන්න දැනගැනීමට චානක හා ජානක අපේක්ෂා කරයි. ඔවුන්ට උපදෙස් දෙන්න.

ඔබගේ පිළිතුර අදාළ අධිකාරයන් ඇසුරින් තහවුරු කළ යුතුය.

(ලකුණු 10)

3. "අපගේ අධිකරණ තීරණ මගින් කම්කරු විනිශ්චය සභාවන්හි අධිකරණ පාත්‍රතාවයේ වූ සාධාරණාත්මක ස්වභාවය ස්ථිරවම හඳුනාගෙන ඇත. කෙසේවෙතත්, සේවකයින්ගේ දුක්ගැනවිලි සඳහා සාධාරණ හා යුක්තිසහගත ආකාරයෙන් ප්‍රතිකර්ම සැපයීමේ ක්‍රියාවලිය තුළ කාර්යපටිපාටිමය යෝග්‍යතාව සහ සාක්ෂිමය සුජාතභාවය පිළිබඳ වූ දැක්ම කිසිවෙකුට නැති කර ගත නොහැක".

Saleem Marsoof, J. in *Indrajith Rodrigo v Central Engineering Consultancy Bureau,* (2009) 1 Sri LR 248 at p.260.

කාර්මික ආරවුල් පනතේ ප්‍රතිපාදන හා නඩු තීන්දු නීතිය ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

4. නාමල්, සූර්යා සහ පුත්‍රයෝ පුද්ගලික සමාගමේ සේවකයෙකු විය. මූල්‍ය අර්බුදයක් හේතුවෙන් සූර්යා සහ පුත්‍රයෝ සමාගම තම ඇඟලුම් කම්හල් දෙකක් ඒකාබද්ධ කිරීමට තීරණය කළේය. ඒ අනුව කම්කරු අතිරික්තය හේතුවෙන් නාමල් ඇතුලුව සේවකයින් විසි දෙනෙකුගේ සේවය අවසන් කරනු ලැබිණි. නාමල් සහ අනෙකුත් සේවකයින් මෙම සමාගමෙහි වසර ගණනාවක් සේවය කර ඇත. සමාගමේ කළමනාකාරිත්වය මේ සඳහා නාමල්ගේ කැමැත්ත හෝ කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නොගත්තේය. තම සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් නාමල්ට කිසිදු වන්දි මුදලක්ද ලැබී නොමැත.

පහත කරුණු සම්බන්ධයෙන් නාමල් ඔබගේ උපදෙස් විමසා සිටී

(අ) කම්කරුවන්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඔහුගේ සේවය අවසන් කිරීම වලංගුද?

(ලකුණු 10)

(ආ) නාමල් නැවත පෙර තනතුරේම පිහිටුවීමට හෝ වෙනත් සහනයක් ලබා දෙන ලෙසට සූර්යා සහ පුත්‍රයෝ සමාගමට නියෝග කිරීමට කම්කරු කොමසාරිස්වරයාට බලතල පවතීද?

(ලකුණු 10)

කම්කරුවන්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ අදාළ ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් නාමල්ට උපදෙස් දෙන්න.

5. පෞද්ගලික අංශයේ සේවකයින්ගේ සමාජ සුරක්ෂිතතාව (social security) ප්‍රවර්ධනය කිරීමෙහි ලා පාරිතෝෂික ගෙවීමේ පනතේ ඵලදායිතාවය විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 20)

6. DJ ලෙදර් පුද්ගලික සමාගම ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පාවහන් නිෂ්පාදකයෙකු වන අතර සේවකයෝ 800 ක් පමණ එහි සේවය කරති. සමාගමේ සේවකයින්ගෙන් 650 කට වැඩි පිරිසක් සමාගමේ වෘත්තීය සමිතියක් වන DJ සේවක සමිතියේ සාමාජිකත්වය දරයි. පසුගිය වසරේදී අනෙකුත් සේවකයින් විසින් 'නිදහස් DJ සේවක සමිතිය' නමින් තවත් වෘත්තීය සමිතියක් පිහිටුවා ගත් අතර මේ වන විට සේවකයින් 80 දෙනෙකු එම නව වෘත්තීය සමිතියේ සාමාජිකත්වය දරයි.

2020 ජනවාරි මාසයේදී සුරත්, පරිවාසික සේවකයෙකු වශයෙන් DJ ලෙදර් සමාගමට සම්බන්ධ විය. ඔහු වැඩ භාර ගනු ලබන අවස්ථාවේදී කළමනාකාරීත්වය ඔහුට දන්වා සිටියේ ඔහු යම් වෘත්තීය සමිතියකට බැඳීමට අපේක්ෂා කරන්නේ නම් 'නිදහස් DJ සේවක සමිතිය'ට බැඳිය යුතු බවයි. DJ සේවක සමිතියේ සාමාජිකත්වය ලබා ගැනීම ඔහුගේ සේවයේ ස්ථිරවීම කෙරෙහි බලපෑමට ඉඩ ඇති බව තවදුරටත් ඔහුට දන්වන ලදී.

අලුතින් බඳවා ගනු ලබන සේවකයින් තම වෘත්තීය සමිතියේ සාමාජිකත්වය ලැබීම වලකාලීම කෙරෙහි කළමනාකාරීත්වය වෙත අප්‍රසාදය පළ කිරීම සඳහා DJ සේවක සමිතියේ සාමාජිකයින් උද්ඝෝෂණයක් සංවිධානය කළහ. මෙම ගැටලුව සම්බන්ධයෙන් DJ සේවක සමිතිය සමඟ කිසිදු සාකච්ඡාවක් පැවැත්වීම කළමනාකාරීත්වය ප්‍රතික්ෂේප කළේය. උද්ඝෝෂණයෙන් දින කිහිපයකට පසු සමාගම විසින් DJ සේවක සමිතියේ ඇතැම් නිලධාරීන්ද ඇතුලුව සේවකයින් 10 දෙනෙකු සේවයෙන් ඉවත් කරනු ලැබීය. වෘත්තීය සමිතිය චෝදනා කර සිටියේ එම සේවයෙන් ඉවත් කිරීම් තම වෘත්තීය සමිති සාමාජිකයින් අගතියට පත් කිරීම උදෙසා සිදු කළ ක්‍රියාවන් බවයි. ඒ අනුව DJ සේවක සමිතියේ සාමාජිකයින් විසින් කළමනාකාරීත්වයේ අත්තනෝමතික තීරණයන්ට එරෙහිව වැඩවර්ජන ක්‍රියාමාර්ගයක් ආරම්භ කරන ලදී.

00536

වැඩවර්ජන කාලය තුළදී 'නිදහස් DJ සේවක සමිතියේ' සියලු සේවකයින් වැඩට වාර්තා කළ අතර ඔවුන්ගේ වැටුපට අමතරව විශේෂ දීමනාවක් ලබා දෙන ලදී. වැඩවර්ජනයේ ප්‍රතිඵලයක් ලෙස ඇතැම් විදේශ ඇනවුම් සම්පූර්ණ කිරීමට සමාගම අපොහොසත් වූ අතර එමගින් සමාගමට විශාල මූල්‍යමය පාඩුවක් සිදු විය. වැඩවර්ජකයින්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සමාගමේ කළමනාකාරිත්වය අදහස් කරයි.

ඉහත සිද්ධියේ ඇති නෛතික ගැටලු හඳුනාගෙන අදාළ අධිකාරයන් ඇසුරින් අදාළ පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

7. (අ) ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය තුළ කාන්තා සේවිකාවන්ගේ වැඩ කරන පැය ගණන, රාත්‍රී වැඩ මුර, ප්‍රසූත නිවාඩු සහ සේවා තත්වයන් සම්බන්ධයෙන් ඇති ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන විවේචනාත්මකව පහදන්න.

(ලකුණු 12)

(ආ) පවතින නෛතික රාමුව මගින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය තුළ කාන්තා සේවිකාවන් මුහුණ දෙන ගැටලු සහ අභියෝග ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කරන බව ඔබ සිතන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 08)

8. පහත සඳහන් ඕනෑම දෙකක් (02) පිළිබඳ විස්තර කරන්න.

(අ) සාමූහික කේවල්කරණය හා සාමූහික ගිවිසුම්

(ආ) ළමුන් සේවයේ යෙදවීම

(ඇ) කාර්මික බේරුම්කරණය

(ලකුණු 10 x 2 = ලකුණු 20)

**හිමිකම් ඇවිරිණි***